බන්ධ/කෝ/ජනරාල් චක්‍රලේඛ අංක : 17 /2010

මගේ අංක / කෝ04/මත්ද්‍රව්‍ය/2010
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09 .
2010.04.25වන දින .

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත .

**බන්ධනාගාර ආයතන වලින් සෝදිසි කිරීමේ දී අත් අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය සම්බන්ධවයි.**

ආයතන තුල කරනු ලබන සෝදිසි කිරීම් වලදී අත්අඩංගුවට ගනු ලබන මත්ද්‍රව්‍ය පිළිබඳ විස්තර ලබා ගැනීමේදී එම විස්තර ලේඛන ගතව නොතිබීම හේතුවෙන් නිවැරැදි තොරතුරු ලබාගැනීමේදී හා අධිකරණ කටයුතු වලදී විවිධ දුෂ්කරතා පැනනැගී ඇත . එබැවින් මින් ඉදිරියේදී නිළධාරීන්ගේ සෝදිසි කිරීම් වලදී හෝ වෙනයම් අකාරයකින් ආයතන වලින් හෝ සිර සැකකරුවන් වෙතින් අත්අඩංගුවට ගන්නා මත්ද්‍රව්‍ය පිළිබඳ වෙනම ලේඛනයක් පවත්වගෙන යාමට සියළුම අධිකාරිවරු විසින් වගබලා ගතයුතු බවට මෙයින් දන්වමි . එම ලේඛනයට අත්අඩංගුවටගත් දිනය, අත් අඩංගුවටගත් අය , මත්ද්‍රව්‍ය වර්ගය , ප්‍රමාණය , අත්අඩංගුවට පත්වූ ආකාරය හා ගත් ක්‍රියාමාර්ගය ආදී කරුණු ඇතුලත් විය යුතුය.

තවද ආයතන තුල සෝදිසි කිරීම් වලදී හෝ ඉන් බැහැරව අත්අඩංගුවට ගන්නා හෙරොයින් ගංජා ඇතුළු සියළුම වර්ගවල මත්ද්‍රව්‍ය අදාල ආයතනයට අයත් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානයට පැමිණිලි කර භාර දීමෙන් පසු ඒ පිළිබඳ අධ්‍යක්ෂක, පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය වෙත වහාම දැනුම්දීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙමි. තවද මේ සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් (ක්‍රියාකාරී ) වෙතද දැනුම් දීමට කටයුතු කරනලෙසට වැඩිදුරටත් දන්වා සිටිමි .

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්